# සිවි වැදෑරුම් ක්ෂේත්‍ර පුහුණුව

දැක්ම / දර්ශනය

ඇතුල්වීම

සුභාරංචිය

ගෝලත්වය

ක්‍රියා 2 අධ්‍යනය සහ විධාන 7

පියවර 8 ක්‍රියාවලිය

දිගු කාලීන ගෝලත්වය

සභා පිහිටුවීම

සරල සභා අධ්‍යනය

ඉලක්ක පිහිටුවීම

# අතිරේක අධ්‍යයනයන්

කහ ආලෝක උපාය

බව්තිස්ම පාඩම

# සිවි වැදෑරුම් ක්ෂේත්‍ර පළමු පුහුණුව

# අන්තර්ගතය

# <u>දර්ශනය</u>

දෙවියන් වහන්සේගේ කැමැත්ත කුමක් ද ?

මලාකි 1 : 11

මක්නිසාද ඉර උදාවන තැන පටන්, බස්නා තැන දක්වා මාගේ නාමය ජාතීන් අතරේ උතුම් ය.


දෙවියන් වහන්සේගේ සැලැස්ම කුමක් ද ?

මතෙව් 16 : 16 - 19 සහ මතෙව් 28 : 18 - 20

ජේසුස් වහන්සේ තම සභාව ගොඩනගන බව උන්වහන්සේ පැවසීය අප ගොස් සුභාරංචිය දේශනා කර, ගෝලයන් බිහිකර, ඔවුන් එකට ඒකරාශී කල යුතු ය. ඉන් පසු අන් අයටද එසේ කරන ලෙස අප ඉගැන්විය යුතු වේ.





මෙම පද අධ්‍යනය කිරීමෙන් පසු, සියලු ජනයාට සහ සියලු ස්ථානවලට ලගාවීම සඳහා දෙවියන් වහන්සේගේ සැලැස්ම ( මතෙව් 16 : 16 - 19 සහ මතෙව් 28 : 18 - 20 ) මතක තබා ගැනීමට උපකාර වන පින්තූරයක් ලෙස පහත පින්තූරය අඳින්න.



# ඇතුල්වීම (පළමු ක්ෂේත්‍රය)

පුද්ගලයන් වර්ග දෙකක් ඇත. ඔබ දන්නා පුද්ගලයන් සහ ඔබ නොදන්නා පුද්ගලයන්. අපගේ ජීවිතය තුළ දැනටමත් සිටින නොඇදහිලිවන්තයන් පිළිබඳව සිතීමට අපි ඔයිකොස් සිතියමක් ( Oikos map ) නිර්මාණය කරමු. අප නොදන්නා පුද්ගලයන් වෙත යන්නේ කෙසේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා අපි ලූක් 10 : 1 - 11 දක්වා අධ්‍යනය කරමු.

## ඔයිකොස්




යොහාන් 1 : 35 - 42 කියවන්න.
විශ්වාස කලේ කවුරුන් ද ? මුලින්ම කියන්න ගියේ කාට ද ?

ඇන්ඩෘ, ඔහුගේ සහෝදරයා වූ සීමොන් පේදුරුට පැවසීටම ගියා ය.

ඔයිකොස් සිතියමක් නිර්මාණය කරන්න.

## ලූක්

ලූක් 10 : 1 - 11 කියවන්න.

| යේසුස් වහන්සේ ගෝලයන් හට කරන්නට පැවසූවේ මොනවාද ? | යේසුස් වහන්සේ ගෝලයන් හට කරන්නට එපා යැයි පැවසූවේ මොනවාද ? |
|---|---|
| • 2 x 2 ( පදය 1 )<br>• යාච්ඤා කරන්න ( පදය 2 )<br>• යන්න ( පදය 3 )<br>• "සමාදානය වේවා" යැයි පවසන්න.<br>• නිවසේදී ආචාර කරන්න. ( පදය 5 )<br>• නිවසේ නතර වී සිටින්න. ( පදය 7 )<br>• ආහාරපාන ගන්න ( පදය 7 )<br>• රෝගීන් සුව කරන්න ( පදය 9 )<br>• ස්වර්ග රාජ්‍යය ප්‍රකාශ කරන්න. / සුභාරංචිය පදය ( පදය 9 )<br>• පාදවල දූලි ගසා දමන්න ( පදය 10 ) | • මුදල් පසුම්බියක්වත්, මල්ලක්වත්, පාවහන්වත් රැගෙන නොයන්න. ( පදය 4 )<br>• අතර මගදී / මාර්ගයේදී කිසිවෙකුට ආචාරකිරීමෙන් වළකින්න. ( පදය 4 )<br>• ගෙයින් ගෙට නොයන්න. ( පදය 7 ) |

ලූක් 10 වන පරිච්ඡේදයෙහි සඳහන් උපදෙස් හා සසඳන පිණිස පහත ජේද අතර සමානව පවතින ක්‍රියා මොනවාද ?

ක්‍රියා 16 : 11 - 15

- 2 x 2 ( පදය 16 "අපි" )
- යාච්ඤා කරන්න. ( පදය 13 - යාච්ඥා ස්ථානයක් වෙත ගියාය. )
- යන්න ( පදය 13 )
- සුභාරංචිය ( පදය 13 , 14 )
- නිවසේ නතර වී සිටින්න ( පදය 15 )

ක්‍රියා 16 : 25 - 40

- 2 x 2 ( පදය 25 පාවුල් සහ සිලස් )
- යාච්ඤාව ( පදය 25 )
- සුභාරංචිය ( පදය 31 - 32 )
- ආහාර පාන ගන්න / කන්න ( පදය 34 )
- නිවසේ නතර වී සිටින්න ( පදය 34 )

ක්‍රියා 10 : 1 - 48

- 2 x 2 ( පදය 23 ී පේත්‍රුස් සහ සහෝදරයන් )
- යාච්ඤාව ( පදය 9 )
- යන්න ( පදය 23 )
- නිවසේ නතර වී සිටින්න ( පදය 48 )
- සුභාරංචිය ( පදය 34 - 43 )

ක්‍රියා 18 : 1 - 11

- 2 x 2 ( පදය 1 - 5 පාවුල්, ප්‍රිස්කිලා සහ අකිලා )
- යන්න ( පදය 7 )
- නිවසේ නතර වී සිටින්න ( පදය 11 )
- සුභාරංචිය ( පදය 8 )

**නිගමනය** : ලූක් 10 9 1 - 11 සහ ක්‍රියා පොතෙහි ජේද හරහා 2 x 2 ගමන් කිරීම. යාච්ඤා කිරීම, සුභාරංචිය බෙදා ගැනීම හා විශ්වාස කරන අයගේ නිවසෙහි රැඳී සිටීමේ රටාවක් අපට දැකගත හැක.

ලූක් 10 සිදු කිරීමට ඔබ යන්නේ කොහේදැයි දෙවියන් වහන්සේගෙන් අසන්න.

# සුභාරංචිය ( දෙවන ක්ෂේත්‍රය )

2 - 3 - 4

2: කොටස් දෙකක් ඇත. අපගේ කතාව ( සාක්ෂිය ) සහ ජේසුස් වහන්සේගේ කතාව ( සුභාරංචිය)

3: අපගේ කතාවේ කොටස් 3 ක් ඇත.

1. ජේසුස් වහන්සේට පෙර ජීවිතය
2. ජේසුස් වහන්සේව අපට මුණ ගැසුණේ කෙසේ ද ?
3. ජේසුස් වහන්සේගෙන් පසු ජීවිතය



4: ජේසුස් වහන්සේගේ කතාවෙහි කොටස් 4 ක් ඇත.

1. මැවීම.
2. පාපය
3. ජේසුස් වහන්සේ - මරණය - භූමිදානය - නැවත නැගිටීම ( කොරින්ති 15 : 3 - 4 )

පහත දැක්වෙන්නේ ඔබගේ අත භාවිතා කරමින් සුභාරංචිය බෙදා ගැනීම සඳහා භාවිතා කලහැකි සරල හා ප්‍රතිනිෂ්පාදනය කල ක්‍රමයකි.

1. මේ ඉන්නේ දෙවියන් වහන්සේ (ඇඟිලි)
   මේ ඉන්නේ මනුෂ්‍යයා (මාපට ඇඟිල්ල)



2. පටන් ගැනීමේදී මනුෂ්‍යයා හට දෙවියන් වහන්සේ සමඟ පරිපූර්ණ සබඳතාවක් පැවතුණි.



3. පසුව, මනුෂ්‍යයා පවුකල අතර, දෙවියන් වහන්සේගෙන් වෙන් වන ලදී. අපද පවුකොට දෙවියන් වහන්සේ කෙරෙන් වෙන් වී ඇත. අපහට සාමය නැත්තේ එම නිසාවෙනි.



4. අප දෙවියන් වහන්සේ වෙත පූජා ඔප්පු කරමින් / උන්වහන්සේට තෑගි ලබා දෙමින් එම සබඳතාවය නැවත ප්‍රතිෂ්ඨාපනය කරගැනීමට උත්සාහ කරනවා. යහපත් ක්‍රියා භාවනා කිරීම් සහ සේවය වැනි දේවල් අප කරනවා. මනුෂ්‍යයාගේ පූජා/ත්‍යාග වලින් දෙවියන් වහන්සේ සමඟ අපගේ සබඳතාවය ප්‍රතිෂ්ඨාපනය කල නොහැක. අප තවදුරටත් වෙන්ව / දුරස්ව සිටිමුව.



5. දෙවියන් වහන්සේ අපට ප්‍රේම කර අපහට ගැලවීමේ මාර්ගයක් සාදාදුන් සේක. උන්වහන්සේ අපට උන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස් වහන්සේව ලබා දෙන ලදී.



6. අපගේ පාපයන් උදෙසා දඩුවම යේසුස් වහන්සේ විඳදරාගත් සේක. උන්වහන්සේව කුරුසියක් පිට මරණයට පත්කරන ලදී.



7. උන්වහන්සේව සොහොන් ගෙයක් තුල තැන්පත් කරන ලදී.



8. දින 3 න් පසුව යේසුස් වහන්සේ නැවත නැගිට්ට සේක.





9. අප එය විශ්වාස කොට. පසුතැවිලි වී, යේසුස් වහන්සේව අනුගමනය කරන්නේ නම් උන්වහන්සේ සඳහටම අපගේ පවු කමා කරන සේක.



10. යේසුස් වහන්සේ තුලින් අපගේ පව් කමා කොට දෙවියන් වහන්සේ සමඟ අපගේ සබඳතාවය අප ආරම්භයේදී පැවති ලෙසටම ප්‍රතිෂ්ඨාපනය කෙරේ.



11. ඔබ මෙය විශ්වාස කොට යේසුස් වහන්සේව අනුගමනය කිරීමට කැමති ද ? ඔබගේ පව් කමා කරනවාට ඔබ කැමති ද ?



රෝම 10 : 9 යේසුස් වහන්සේ ස්වාමින් වහන්සේ යැයි නුඹේ මුඛයෙන් ප්‍රකාශ කරන්නෙහි නම්, දෙවියන් වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගලවනු ලබන්නේ ය.

# ගෝලත්වය ( තුන්වැනි ක්ෂේත්‍රය )

## ක්‍රියා 2 අධ්‍යනය

ක්‍රියා 2 : 37 - 47 කියවන්න.

නව ඇදහිලිවතුන් කලේ මොනවාද ?

- පසුතැවිලි වී විශ්වාස කරන්න ( 38 පදය )
- බව්තිස්මය ( 38, 41 පද )
- ඉගැන්වීම ( 42 පදය )
- සහභාගීත්වය ( 42 පදය )
- ස්වාමීන් වහන්සේ ( 42, 46 පද )
- යාච්ඤාව
- ආශ්චර්යයන් සහ ලකුණු : ශුද්ධ ආත්මය
- අපෝස්තලුවරුන් / නායකයන් ( 42, 43 පද )
- දෙන්න ( 44, 45 )
- ප්‍රේම කරන්න ( 44, 45 පද )
- නමස්කාරය ( 47 පදය )
- සුභාරංචිය / ගුණානය කිරීම ( 47 පදය )

ක්‍රියා පෙතේ දෙවන පරිච්ඡේදයෙහි සඳහන් මෙම ඡේදයෙන්, කෙටි කාලීන ගෝලයන් වීමේදී නව ඇදහිලිවන්තයන්ට ඉගැන්වීමට මූලික පාඩම් 7 ක් අපට හමුවේ. සෑම පාඩමක් සඳහාම "පියවර 8 ක්‍රියාවලිය" සහ ප්‍රශ්න භාවිතා කරමින් අධ්‍යනය කිරීම සඳහා කතාන්දරයක් සහ විධානයක් ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | පසුතැවිලිව විශ්වාස කරන්න. | කතාව<br>විධානය | : ලූක් 19 : 1 - 10<br>: මාර්ක් 1 : 14 - 15 |
| 2. | බව්තිස්ම වන්න. | කතාව<br>විධානය | : ක්‍රියා 8 : 26 - 39<br>: මතෙව් 28 : 18 - 20 |
| 3. | යන්න ප්‍රකාශ කරන්න | කතාව<br>විධානය | : යොහාන් 4 1 : 1 - 42<br>: මාර්ක් 16 : 15 |
| 4. | යාච්ඤා කරන්න | කතාව<br>විධානය | : මතෙව් 6 : 5 - 15<br>: මතෙව් 22 : 37 - 39 |
| 5. | ප්‍රේම කරන්න. | කතාව<br>විධානය | : ලූක් 10 : 25 - 37<br>: 22 : 37 - 39 |
| 6. | දෙන්න | කතාව<br>විධානය | : මාර්ක් 12 : 41 - 44<br>: මතෙව් 6 : 1 - 4 |
| 7. | ස්වාමීන් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය | කතාව<br>විධානය | : ලූක් 22 : 7 - 20<br>: මාර්ක් 26 : 26 - 29 |

# පියවර 8 ක්‍රියාවලිය

පහත දැක්වෙන්නේ ගෝලත්ව පාඩම් සඳහා නව ඇදහිලිවන්තයන් හමුවීමේදී භාවිතා කරන ක්‍රියාවලියයි. සභාව එකට රැස්වන විටද මෙම ක්‍රියාවලිය භාවිතා කරනු ඇත.

1. යාච්ඥාව
2. නමස්කාර
3. සමාලෝචනය

   අ) අප අවසන් වරට හමු වූ අවස්ථාවේදී ඔබ ඉගෙන ගත්තේ මොනවා ද ?
4. ගණන් දීම / වගවීම.

   අ) අප අවසන් වරට හමු වූදා සිට ඔබ සුභාරංචිය බෙදාගෙන ඇත්තේ කා සමඟ ද ?

   ආ) අප අවසන් වරට හමු වූ විට ඉගෙන ගත් දේවල් වලට ඔබ කීකරු වූයේ කෙසේ ද ?
5. නව ඉගැන්වීම.

   අ) මෙම කතාව දෙවියන් වහන්සේ පිළිබඳව අපට උගන්වන්නේ මොනවා ද ?

   ආ) මෙම කතාව මනුෂයා පිළිබඳව අපට උගන්වන්නේ මොනවාද ?

   ඇ) අප විසින් නොකල යුතු කිසිවක් මෙම කතාවෙහි තිබේද ? ( පාපයක් )

   ඈ) අප විසින් අනුගමනය කලයුතු උදාහරණ කිසිවක් මෙම කතාවෙහි තිබේද ?

   ඉ) අප විසින් කීකරු විය යුතු විධාන කිසිවක් මෙම කතාවෙහි තිබේද ?
6. පුහුණු වීම.
7. සැලසුම් කිරීම.
8. යාච්ඥාව

# දිගු කාලීන ගෝලත්වය

විධාන 7 සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, ඔබට දිගු කාලීන ගොලයෙකු වීමට මාර්ක් පොත හෝ ක්‍රිස්තුස් වහන්සේට මැවීම කතා භාවිතා කළ හැක. පියවර 8 ක්‍රියාවලියේදී 5 වන පියවර සඳහා ( නව ඉගැන්වීම ) එකම ප්‍රශ්න ( දෙවියන් වහන්සේ පිළිබඳ අප ඉගෙන ගන්නේ මොනවා ද ? වැනි ) සමඟ මෙම කතා යොදාගත හැක.

උත්පත්ති පොතේ සිට එළිදරව් පොත දක්වා බයිබල් කතාන්දර පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වර්ධනය කර ගැනීම සඳහා මෙම දිගු කාලීන ගෝලත්ව පාඩම් නව ඇදහිලිවන්තයන් හට උපකාරී වේ.

**ලෝකයේ මැවීම.**

1. ලෝකයේ මැවීම - උත්පත්ති 1 : 1 - 2 - 3
2. මිනිසා මැවීම - උත්පත්ති 2 : 4 - 2 - 5

**පාපයේ කතාන්දරය - මිනිසාගේ අකීකරුකම**

3. පළමු පාපය සහ විනිශ්චය - උත්පත්ති 3 : 1 - 24
4. පාපය ආදම් සහ ඒවගේ දරුවන් කරා පැතිර යයි. උත්පත්ති 4 : 1 - 16
5. පාපය සමස්ථ ලෝකය පුරාම පැතිර යයි උත්පත්ති 6 : 11 - 22, 7 : 11 - 23, 8 : 14 - 22

**ගලවා ගැනීමේ කතාන්දරය : පාපයේ මිලය සහ සමාව දීමේ පොරොන්දුව**

6. ආබ්‍රහම් වෙත දෙවියන් වහන්සේගේ පොරොන්දුව, උත්පත්ති 12 : 1 - 9, 15 : 1 - 6
7. ඊසාක් වෙනුවට පූජා කිරීම සඳහා ආදේශක පූජාවක් දෙවියන් වහන්සේ සපයයි, උත්පත්ති 22 : 1 - 19
8. ආබ්‍රහම්ගෙන් පැවතෙන්නන් වහල්භාවයට පත්වීම සහ මුදවාගන්නා / විමුක්තිදායකයා ලෙස ආබ්‍රහම්ව දෙවියන් වහන්සේ තෝරාගැනීම. නික්මයාම 1 : 1 - 14, 3 : 1 - 14
9. පාස්කු මංගල්‍යය - බැටළු පාටවාගේ ලේ - නික්මයාම 12 : 1 - 28
10. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ දස පනත ලබාදීම සහ නීතිය කඩ කිරීම පිළිබඳ කැපකිරීම් - නික්මයාම 20 : 1 - 21, ලෙවිකථාව 4 : 1 - 4
11. දෙවියන් වහන්සේගේ මිනිසුන් දිගින් දිගටම පවු කරයි. විනිශ්චය කාරයාගේ පොත 2 : 10 -23
12. දෙවියන් වහන්සේ ගැලවුම් කාරයෙක් එවනු ඇත. යෙසායා 9 : 1 - 7 සහ 53 ගැලවීමේ පොරොන්දුව සම්පූර්ණ කිරීම පිණිස යේසුස් වහන්සේ පැමිණෝ
13. අනාගත වාක්‍යයට අනුව යේසුස් වහන්සේගේ උපත මතෙව් 1 : 1" 25

14. යේසුස් වහන්සේගේ බව්තිස්මය බලව දෙවියන් වහන්සේගේ බැටළු පැටවානෝ ! ආත්මයාණන් වහන්සේ සහ යොහාන්ගේ සාක්ෂිය, මතෙව් 3 : යොහාන් 1 : 29 - 34
15. ක්‍රිස්තුස් වහන්සේව පරීක්ෂා කිරීම පිණිස - මතෙව් 4 : 1 - 11
16. පාපයට සමාව දීම සඳහා යේසුස් වහන්සේට අධිකාරී බලය ඇත. අංශභාග රෝගියා සහ යහළුවන් හතර දෙනා. ලූක් 5 : 17 - 26
17. ස්වභාව ධර්මය කෙරෙහි යේසුස් වහන්සේට බලය ඇත. කුණාටුව නිශ්චල කිරීම. - මාර්ක් 4 : 35 - 41
18. ආත්මයන් කෙරහි බලය යේසුස් වහන්සේට ඇති ගෙරසේනයේ යක්ෂාවේෂ වූවෙකුට සුව කිරීම - මාර්ක් 5 : 1 - 20
19. යේසුස් වහන්සේට මරණය කෙරෙහි බලය ඇත. ලාසරුස්ව මරණින් නැගිටවීම - යොහාන් 11 : 1 - 45
20. සදාකාල ජීවනය ගෙන එන ගැලවුම්කරු යේසුස් වහන්සේ වේ. යොහාන් 4 : 1 - 26, 39 - 42

**පොරොන්දුව ඉෂ්ඨ කිරීම**

21. අන්තිම රාත්‍රී භෝජනය "මේ නුඹලා උදෙසා කැඩුනා වූ මාගේ ශරීරයෙයි, නුඹලා උදෙසා වැගිරුවා වූ මාගේ රුධිරයයි" - මතෙව් 26 : 18 - 30
22. යේසුස් වහන්සේව පාවාදෙනු ලැබ අත්අඩංගුවට ගෙන, බොරු චෝදනා එල්ල කර, නඩු විභාග කර මරණයට නියම කරන ලදී. - යොහාන් 18 : 1 - 19 : 16
23. කුරුසිපත් කිරීම, යේසුස් වහන්සේට පක්ෂව සහ එදිරිව තීරණය "එය නිමා විය" - යොහාන් 19 : 16 - 42
24. නැවත නැගිටීම සහ ගෝලයන්ට සහ අනුගාමිකයන්ට දර්ශනය වීම. - ලූක් 24 : 1 - 35
25. යේසුස් වහන්සේ පියාණන් වහන්සේ වෙත නැවත යාම. නැගීම ලූක් 24 : 1 - 53
26. අපගේ ප්‍රතිචාරය - නව උපත - යොහාන් 3 : 1 - 21
27. යේසුස් වහන්සේ නැවත එනසේක - 1 තෙසලෝනික 4 : 13‘ 18

# සභාව (සිව්වන ක්ෂේත්‍රය)

## සරල සභා අධ්‍යනය

මෙම බයිබල් පද කියවා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. සභාව යනු **කවුරුන් ද** ? ක්‍රියා 2 : 37 - 41
   බව්තිස්මය ලබා සිටින ඇදහිලිවතුන්

2. සභාව මුණාගැසෙන්නේ **කොහේ ද** ? ක්‍රියා 2 : 46, රෝම 16 : 3 - 5
   සභාවට, නිවෙස්වල, සභා ගොඩනැගිලි තුල හෝ ගහක් යට..... යනාදී ලෙස හමුවිය හැක.

3. සභාව මුණ ගැසෙන්නේ **කවදා ද** ? හෙබ්‍රෙව් 10 : 24 - 25
   සභාව නිරන්තරයෙන් සහ නිතිපතා රැස්වන තාක්කල්, කාලය කුමක් ද යන්න වැදගත් නොවේ.

4. සභාව රැස්වන්නේ **ඇයි** ? 1 කොරින්ති 10 : 3
   දෙවියන් වහන්සේගේ මහිමය උදෙසා

5. සභාව කරන්නේ **කුමක් ද** ?
   ක්‍රියා 2 : 37 - 47 (තුන්වන ක්ෂේත්‍රයෙහි සඳහන් ක්‍රියා 2 අධ්‍යනයම වේ.) පසුතැවිලිව විශ්වාස කරන්න. බව්තිස්මය, ඉගැන්වීම, පංගුකාරකම, රොටි කැඩීම / ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය, යාච්ඤාව, ශුද්ධ ආත්මය / ලකුණු සහ පුදුමයන්, අපෝස්තලුවරුන් / නායකයන්, දෙන්න, ප්‍රේම කරන්න, නමස්කාර කරන්න, සුභාරංචිය බෙදාගන්න / වැඩි වීම.

 - බව්තිස්මය දීම

 - ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය දීම.

 - බව්තිස්මය දීම


 - යාච්ඤාව


 - ප්‍රේමය

 - දෙවියන් වහන්සේගේ වචනය

 - නමස්කාරය

 - වැඩිහිටියන්

 - දීම




දිනය 2018
ස්ථානය - නව දිල්ලිය
නායකයා - රාකේෂ්

# ඉලක්ක පිහිටුවීම

ඔබ පුහුණු වී ඇති එක් එක් ක්ෂේත්‍රය සඳහා ඉලක්ක තැබීමට ක්ෂේත්‍ර හතරේ රාමුව භාවිතා කරන්න. උගන්වන ලද ක්ෂේත්‍ර සහ මෙවලම් සඳහා පමණක් ඉලක්ක තබන්න. සෑම කෙනෙක්ම ක්ෂේත්‍ර හතර ඇඳගෙන එක් එක් ක්ෂේත්‍රය තුල ඔවුන්ගේ ඉලක්ක ලිවීමට සලස්වන්න. පහත දැක්වෙන්නේ එක් එක් ක්ෂේත්‍ර සඳහා විය හැකි ඉලක්ක පිළිබඳ උදාහරණයකි.

**ඇතුල්වීම**

- ඔබගේ ඔකියොස් ලැයිස්තුවෙන්, මේ මාසය තුල ඔබ බෙදා ගන්නේ කා සමඟ ද ?
- බෙදාගැනීම සඳහා ස්ථාන සහ පුද්ගලයන් ලබාදෙන ලෙස දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්න.

**සුභාරංචිය**

- මේ මාසය තුල කොපමණ වාර ගණනක් ඔබ සුභාරංචිය බෙදා ගත්තේ ද ?
- සරල මෙවලම යොදා ගනිමින් සුභාරංචිය බෙදා ගැනීම සඳහා මෙම මාසයේදී ඔබ පුහුණු කරන්නේ කාව ද ?

**නායකත්ව සංවර්ධනය**

ඔබගේ "තිමෝතිලා" සමඟ මුණ ගැසීම සඳහා මේ මාසයේ ඔබගේ සැලැස්ම කුමක් ද ?

**සභාව**

- එකම රැස්වීම සඳහා පියවර 8 ක්‍රියාවලිය ඔබ විසින් භාවිත කරන සභා කිසිවක් තිබේද ?

**ගෝලත්වය**

- මේ මාසයේදී ඔබ විසින් විධාන 7 ආරම්භ කිරීමට බලාපොරොත්තු වන නව ඇදහිලිවතුන් කිසිවෙක් සිටී ද ?

# අතිරේක අධ්‍යනයන් සහ උපකරණ පෙට්ටිය

# කහ ආලෝක උපාය

ඔබගේ යාච්ඤාවෙන් හෝ සුභාරංචිය සහ සාක්ෂිය බෙදාගැනීමෙන් අනතුරුව යේසුස් වහන්සේව විශ්වාස කිරීමට තවමත් සූදානම් නැති එසේ නමුත් තවදුරටත් ඇසීමට කැමති නොඇදහිලිවතුන් සමඟ ඔබට මෙම කතා බෙදාගත හැක.

**බලයේ කතාන්දර**

1. ස්වභාවධර්මය කෙරෙහි ආධිපත්‍යය යේසුස් වහන්සේට ඇත. මාර්ක් 4 : 35 - 14
2. යක්ෂයන් කෙරෙහි බලය යේසුස් වහන්සේට ඇත. මාර්ක් 5 : 1 - 20
3. රෝගීන් කෙරෙහි බලය යේසුස් වහන්සේට ඇත. මාර්ක් 5 : 25- 34

# බව්තිස්ම අධ්‍යනය

ඡේද කියවා පහත වගුව සම්පූර්ණ කරන්න.

| | බව්තිස්ම කළේ කවුද ? | බව්තිස්ම දුන්නේ කවුද ? | කවදාද ? |
|---|---|---|---|
| **යොහාන් 4:1-2** | ඇදහිලිවතුන් | ජේසුස් වහන්සේගේ ගෝලයන් | ? |
| **ක්‍රියා 2:36-41** | ඇදහිලිවතුන් 3000 | ? | එම දවසේදී |
| **ක්‍රියා 8:36-38** | නපුංසකයා | පිලිප් | හදිසියෙන් |
| **ක්‍රියා 9:3-18** | සාවුල් | අනනියස් | අන්ධව සහ නිරාහාරව සිටීමෙන් දින 3 ට පසුව |
| **ක්‍රියා 10:24, 44-48** | කොර්නේලියස් සහ නිවැසියන් | ? | හදිසියෙන් |
| **ක්‍රියා 16:13-15** | ලිදියා සහ නිවැසියන් | ? | හදිසියෙන් |
| **ක්‍රියා 16:31-34** | පිලිප්පියේ හිරගෙදර මුලාදෑනියා සහ නිවැසියන් | ? | හදිසියෙන් |
| **ක්‍රියා 18:8 (1 කොරින්කි) 1:14)** | ක්‍රිස්පස්, නිවැසියන් කොරින්තියේ බොහෝ අය | පාවුල් සහ ගෝලයන් | අදහාගැනීමෙන් පසු |
| **ක්‍රියා 19:1-7** | යොහාන්ගේ ගෝලයන් | ? | ජේසුස් වහන්සේගේ බව්තිස්මය සහ ශුද්ධ ආත්මයාණන් වහන්සේ පිළිබඳ ඇසීමෙන් පසු |
| **නිගමනය** | **අදහාගත් අය** | **ගෝලයන්** | **අදහාගැනීමෙන් පසු ඉතා ඉක්මනින්** |